
ඔවුනු හතරක වෘතාන්තය
ශයිනි අමාධි ඒකනායක

# සෘතු හතරක වෘතාන්තය

ඩබ්.ඒ.එම්. ශයිනි අමා දි ශිහනායා ඒකනායක

ISBN 978-624-206-877-0

වෙනත් කෘති
අත්දකීම.
ආදරය.

# පිදුම

E Book වැඩසටහනත් සමග අපට මෙම පොත් ලිවීමට උපකාර කර සියලූම ගුරුදෙගුරුන්ට හා නැන්දලා මාමලා ටත් E book සංකල්පය හදුන්වඳුන් විදුහල්පතිතුමියටත්,

මගේ පවුලේ සියලු දෙනාටත් , මගේ යහලු යෙහෙලියන්ටත් ,

මෙම පොත් ලිවීමට වචනයකින් හෝ සහය දුන් සැමට මෙම පොත පුදමි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

"ලිලී,ඩැෆිඩිල්,(black eye) සූසන් යනු සෘතු තුනක මල් ය. කාටවත් එකම සෘතුවක මෙම මල් තුනම දැක ගැනීමට බැරි උනා. සමහරෙක් එක් මලක් කඩා අනෙක් සෘතුවට යන තුරු මල ආරක්ෂා කලා. නමුත් එය අනෙක් සෘතුවට යන විට පරවී තිබුනා.

ඒවුනාට එක් ගැහැනු ළමයෙක්ට මෙය වෙනස් කිරීමට අවශ්‍ය වුනා. ඇයගේ නම කැමේලියා .ඇය චන්ද්‍රග්‍රහනයක් ඇති දිනක එක් සෘ තුවකින් තවත් සෘ තුවකට මාරු වෙන දින රාත්‍රියට පෙනෙන සඳෙන් උරා ගත් ආලෝක කිරණ ස්වල්පයක් හා අවශ්‍ය සෘතු වලින් ඉතුරු කරගත් මතක සටහනක් ( සීත සෘතුවෙන් හිම වැන් දේ) හා තවත් දේ එකතු කර මායාකාර බෙහෙත් වට්ටෝරුවක් සාදා එය සඳෙන් එන ආලෝක කිර්ණත් සමග නැවත සඳ වෙත යැවුවා.. මෙයින් ආ පණිවිඩය දැක සඳ කලබල වී God of season (සෘතු දෙවිදුන් ) හට යැවීය. මෙයින් ගොඩක් කෝපයට පත් දෙවිදුන් අතින් අර වට්ටොරුව තිබූ භාජනය කැඩී පෘථිවිය වෙත වැටුනා.

එක් ක්ෂනයකින් සියල්ලම වෙනස් වී සියලුම සෘතූන් එකම වේලාවේ පැමිනියා. ඒවායේ නයකන් වූ winter , summer , autumn සහ spring යන සිව් දෙනාම එකම වේලාවක අවදි වී ඇති අතර ඔවුන්ට හිතා ගන්න බැරි වුනේ God of season හට මොන අවශ්‍යතාව නිසා මේ සියලුම සෘතූන් කැඳවූවේද කියලා.

කොහොම හරි දැන් සියලුම සෘතු වල මල්ද autumn සෘතුව නිසා කොළ හැලුනු ගස්ද spring සෘතුව නිසා නැවතදමන ගස්ද.. winter නිසා ඇති වන හිම summer නිසා දිය වී යනවා.පෘථිවිය දැන් කිසිම සමතුලිතතාවක් නැති ලෙස පෘථිවිය හැඩ ගැසී ඇත.දැඩි අවු රශ්මියට ගිනි ජාලා දැඩි සීතලට හිම පතනය. සතුන්ට හිදීමට නොහැකි තරම් මල් වර්ගද බොහෝය.

මෙම විනාශය බලා නොහැකි නිසා God of season තිරණය කලා කැමේලියා ට දඩුවම් කරන්න කොහොම හරි සෘතූන් හතරම හා God of season එකතු වී වෙන්න යන දැඩි මහන්සියකින් වෙන්න යන විනාශය නවතා නැවතත් සෘතු හතර බෙදා දුන්නා.

කැමේලියාට දුන් දඩුවම හැටියට, කුඩා මලක් වී කන්දක් උඩ තනිව ජීවත් වෙන්න. ඇයට ඇය කල වරද පිළිබඳ තේරුම් යනතුරුම එහි රැඳි සිටීමට සිදු වුනා. එය මුලු පෘථිවිය වම තිබූ උඅසම කන්දයි. ඇයට එම වෙලාවේ දෙවියන් මල් පෙති කීපයක් වැඩිපුර දුන්නේ, ආරක්ශාවටයි.

කෙසේ හෝ එදා පටන් එම කන්දේ උසුලන්නට නොහැකි තරමේ සීතලක් පැවතියා. කිසිදා දිය නොවෙන හිම තට්ටු වලින් කන්දම ආවරණය වී තිබුණා. Gof of season එදා කැමේලියාට කිවේ දීර්ඝකාලීන සීත විවේකයක් ගන්න ලෙසත් ඇයගේ දඩුවම ගෙවුනු පසු ඇයව රැගෙන යන්න එන ලෙසය.

දීර්ඝ , හැමදාම සීත නිවාඩුව නිසා එම කන්ද Ever ± rest ( දීර්ඝ ± නිවාඩුව ) Everest ලෙසත් එය මුදුනේ ඇති මල් Camellia නමිනුත් නම් වුණි."

" හරි...... දැන් නිදා ගන්න. අදට මේ කතාව හොදටම ඇති සුබ රාතියක් මගෙ පැටියෝ. හෙට ඉස්කෝලේ යන්නත් තියෙනවනේ දැන් නිදා ගන්න." තෝමස් මහත්මිය පැවසුවේ දිගු සුසුමක් හෙලමින් ය.

" හරි අම්මා, අහ් අම්මා සමහරවිට අපි ලබන සතියෙ වගේ අර අපි කතා කරගත්තු ගමන යයි. එතකොට ඈන් ට පුලුවන් ජෝජ් ගෙ නංගි ජෝජියානාත් එක්ක සෙල්ලම් උද්‍යානයට යන්න" රොබට් කීවේ ඈන් දෙස බලමින් මද සිනාවක් පාමින් ය.

"ආනේ.... ශෝයි! මට පුලුවන් ජෝජීත් එක්ක ඔන්චිල්ලා පදින්න. ඒවගේම මෙරිගො රවුන්ඩ් යන්න. තව, ස්ටෙෆනි නැන්දගේ ඇපල් ඩෝනට් කන්නත් පුලුවන්....." තව සිනාවක් පාමින් ඉතා සතුටින් ඈන් අම්මා දෙස බලමින් කීවා ය.

"හා හා ඇති යන්න කලින් මෙහෙම නම් ගියාම කොහොම ඇත්ද?

“හරි මගෙ පුංචි සුරංගනාවි, රෙඩ් රූෆ් රාක්ශයා ඇවිත් ඔයාව කන්න කලින් නිදාගන්න.

අහ්! අමතක කරන්න එපා ඔයාගෙ ටින්කබෙල්ට කියන්න ඔයාගේ අලුත් බලාපොරොත්තුව"

අම්මා කීවේ ඈන්ගේ ඇඳේ වම් පැත්තෙන් ඇති මේසය මත තිබූ පුංචි සීනුවක් පෙන්වමින් ය.

සෑම දිනකම නිදා ගැනීමට පෙර ටිංකබෙල් ප්‍රාර්තනාව කිරිම ඈන්ගේ පුරුද්දකි. එය ඉතා ලස්සන කුඩා බෝලයක් මෙනි.. එය සෙලවීමෙන් හරිම සියුම් ශබ්දයක් එයින් පිටවෙ. ටිංකබෙල් ප්‍රාර්ථනව එයට කොඳුරා කියා එහි සීනුව නාද කිරීම අම්මාගේත් ඈන් ගේත් පුරුද්දකි.එය ඇයට අම්මා කියා දුන්නකි. ඈන් පවසන්නේ එය ඇයට ටිංකබෙල් සුරදූතියගෙන් ලැබුනු තෑග්ගක් ලෙසයි. නමුත් අම්මා පවසන්නේ එය ඇයට ලැබුනු තෑග්ගක් ලෙසය. කෙසේ හෝ සෑම දිනකම රොබට් ද රාත්‍රියේ කාටත් නොඇසෙන ලෙස ටිංකබෙල් ප්‍රාර්ථනා වක් සිදු කරයි.

රොබට් තෝමස් යනු වයස අවු.12 ක පුංචි කොලු ගැටයෙකි. යන්තම් තැඹිලි පැහැයක් ගන්නා දිගැටි කොන්ඩයක් සහිත මේ කොලු ගැටයාගේ මුහුණ අම්මාගේත් තාත්තාගේත් අච්චුවක්ම විය. දුඹුරු පැහැති ඇස් හා දිගැටි තැඹිලි කොන්ඩය නිසා ඔහුට යන්තම් කඩවසම් බවක් ගෙන්වීය.

ඈන් තෝමස් යනු ඔහුගේත් තෝමස් මහත්මියගේත් එකම නැගණිය හා එකම දියණිය වූවා ය. වයසින් අවු.08 වූ ඈ ඉතා දැකුම්කලු කැරළි කොන්ඩයකට අයිතිවාසිකම් කීය. කොන්ඩය කෙතරම් දිගු වූවාත් එය කැරළි නිසා එකම ප්‍රමාණයෙන් තිබීම ඈන්ගේත් අම්මාගේත් පහසුවට කරුණක් විය. නිල් වන් දෙනෙත් හා නාසය උඩින් හා කම්මුල් වල ඇති දුඹුරු පැහැති කුඩා ලප ඇයගේ මුහුනට ඇත්තෙන්ම හොඳින් ගැලපුනා ය.ඇයට තිබුනේ රෝමානු නාසයකි. දත් වල පිහිටීමේ වැරැද්දක් ඇති ඈන් දත් සඳහා පළඳනාවක් දමා ගෙන සිටී.ඇත්තෙන්ම පැවසුවහොත් ඇයගේ මුහුනට මේවා ගැළපී ඇත්තෙ කිරට පැණි වාගෙයි.

C. තෝමස් මහත්මිය එසේ නැති නම් කෙටියෙන් තෝමස් මහත්මියයි. කිසිවෙකුත් මුල් නමින් කතා නොකල නිසා ඇය ප්‍රකට වූවේ තෝමස් මහත්මිය කියායි. දිගැටිත් නොමැති කැරළිත් නොවූ කොන්ඩයක් සතු වූ මැයගේ ගොන්ඩය ක්‍රීම් පාටක් හා දුඹුරු පාටක් ගත්තේ ය. ඇය ඇත්තෙන්ම කරුණාවන්ත ගැහැනියකි.

අවසාන වශයෙන් ඩිඩ්ලර් තෝමස් යනු මෙමෙ පවුලේ ජීවයට පණ පොවන්නා වෙයි. ඔහු වෘතීයෙන් නාවිකයෙකි. දීර්ඝ නාවික ගමනකින් පසු නැවතත් නිවසට පැමිනෙනේ මාස පහකින් පමණය. නැව් ගමන් නොමැති නම් මාස දෙකකට සැරයක් නිවසට පැමිණෙයි.

රොබට් ගේ පාසල වන්නේ ඔඅවුන්ගේ නිවසේ සිට 12 කිලෝමීටර් පමණ ඇතින් තිබෙන ස්ටෙල්ඩ් උසස් පාසලයි.ස්ටෙල්ඩ් ප්‍රාතමික පාසල ඈන්ගේ නිවහනක් විය.

රොබට් ට යහලුවන් 6 දෙනෙකු සිටී.ඌරෙකුගේ නහයකට සමාන නහයක් ඇති නිල්ටන් , නිතරම කණ්ණාඩි පළදින ඔවුන්ගේ පංතියේ නොවුනද යහලුවෙකු වන නෙකාලෝ , කණ්ඩායමේ කොටම සහ අමුතු හැඩයකට කොණ්ඩය කපා ඇති mashroom නම් අන්වර්ථ නාමය යෙදූ සෙල්ටර් , නිතරම සැමගේ අවදානයට ලක් වන තියඩෝ , සාමාන්‍ය පණ්ඩිත කමකින් ඇති ඔරිටො , පංතියේ පළමුවැන්නා හා බුද්දිමතා වන ඩෙකර්.

ලබන මාසයේ පැවැත්වෙන්නේ මොවුන්ගේ තුන් වන වාර විභාගය නිසා මොවුන් සූදානම් වන්නේ පාඩම් කිරීමට එකතු වීමටය. මෙය ඔවුන් චාරිකාවක් ලෙස සලකයි.සතියක් පමන එකිනෙකාගේ ගෙවල් වල නතර වෙමින් පාඩම් කිරීමේ කටයුතු කිරීමට මොවුන් සිතා සිටී.

*                *                *

පසු දින උදෑසනම ඈන් සහ රොබට් පාසල් යන්නට සැරසෙමින් සිටී.පාසල් යන දිනට නම් කිසිම කෙනෙකුට තමන්ට නියමිත වැඩේ කරනවා මිස තවත් වැඩ කිරීමට අපහසුය.

තෝමස් මහත්මියා මේ දින වල ගෙදර නොසිටී හෙයින් තෝමස් මහත්මියට සියලුම දේ තනිව කිරීමට සිදු විය.

උදයම අවදි වී කෑම සාදන ගමන් ඈන්වත් රොබට් වත් අවදි කර ඈන්ව පිරිසිදු කර ඈන්ව සූදානම් කරන තුරු රොබට් ඔහුගේ පොත් පෑන් පැන්සල් ආදිය සකසා ගනී. ඈන්ව සූදානම් කර පසු ඇයට කෑම කන්නට දෙයි. ඒ සමගම ඈන් පොත් එත් අහුරා ගනී.

මේ අවස්තාවේදී තෝමස් මහත්මිය රොබට් ව ලෑසිති කරයි. අවු. 12 ක් වුවද ටයි පටිය දා ගැනීමට තවමත් රොබට් ට අපහසුය. පසුව රොබට් ට කෑම ලබා දී තෝමස් මහතිමිය සූදනම් වේ. උදේ 6.30 බසයේ ගොස් මුලින්ම රොබට්ව පාසලට දමා ඈන් සමග ප්‍රාතනමිකයට ගොස් ඈන් වත් පාසලට දා

පාසලේම  ඇය කාලය ගෙවයි.ඈන්ව 12.30 ට පාසලෙන් රැගෙන ගෙදර එයි රොබට් සවසට ඔහුගේ යාලුවන් සමග නිවසට පැමිණෙයි.

" රොබට් අපි මුලින් ම history වගේ දෙයකින් පාඩම් කරන්න පටන් ගමුද?

නැද්ද නිල්ටර් , මතකනේ ගිය පාර අන්තිම වෙලාවෙනෙ ගොඩ දාගත්තේ.

මට නම් හිතා ගන්නත් බෑ මට අසූ ගාණක් තිබ්බා කියලා." හිනා වෙමින් තියඩෝ පැවසුවේ ය.

" ඔව් ඔව් ඒක හොදයි. අපරාදේ හැබැයි අපි ගිය පාර නම් හොදටම පාඩම් කලා රොබට් ලගේ දිහා.  ඒත් ඉතින් වෙනසකටත් එක්ක ඩෙකර් ලගේ දිහා ඉන්න එකත් හොදයි. පස්සේ අපි යමු ඔරිටෝ ගෙ ගෙදර" සෙල්ටර් පැවසුවේ ඔරිටෝ දෙස බලමිනි.

"ඒත් සෙල්ටර්, මට හිතෙනවා අපි මේ පාර ඩෙකර්ගෙ ගෙදර විතරක් ඉමු කියලා. මොනද දැන් අපි සදුදා එහෙ ගිහින් බදාදා ඔරිටොගෙ දිහා යන්න අගහරුවාදා ඉදන් ලෑස්තිවෙනවා. අනික කිලෝ මීටර් ගානක් අයෙත් යන්වා කියන්නේ ඒ කාලෙත් අපට අකුරක් හරි බලා ගන්න තිබ්බා. ඔයාලා මොකද කියන්නේ" රොබට් ඇහුවේ ටිකක් විතර කුතුහලයෙනි.

නිශ්ශබ්දතාවයක් පැවතියද මද වේලාවකින් හඩක් අවදි වීය.

"ම්.... ඔව් හැබැයි ඒකත් ඇත්ත ඒකෙන් අපිට අපේ අවදානේ එක තැනක තියා ගෙන පාඩම්කරන්න වෙන්නෙත් නෑ. මං හිතන්නේ අපිට ගිය සැරේ වුනේ ඕක."                    නෙකාලෝ පැවසුවේ මහත් පුදුමයෙනි.

මද වේලාවකට පසු සියල්ලෝම එය පිළිගත් හ.

"අනේ... අන්න! ස්ටෙෆන් නැන්දගේ ඇපල් ලොලි පොප්ස් අපි යමු... ඔයාලා දන්නවද ඒවා අයිස් ක්‍රීම එක්ක කනකොට තියෙන රස... මන් ගිහින් ඇරම් එන්නම් මට හැමෝගෙන්ම පවුම් බාගෙ ගානෙ දෙන්න..." තියඩෝ කීවේ මහත් ගාම්බීරයෙනි. තියඩෝර් ට අයිස් ක්‍රීම් වලින් තොර වෙන ලෝකයක් නොතිබූ තරම් ය.

සැවොම මුලින් විරෝධය පැවත් එය  අහාරයට ගත්විට  හැමෝටම දැණුනේ ලැජ්ජාවකි.

සවස් වන විට මිතුරන් සියල්ලතම තමන්ගේ නිවෙස් වෙත ගියහ. රොබට් නිවසට පැමිණි විගස අම්මාට ඔවුන්ගේ පාඩම් කටයුතු ගැන විමසීය. අම්මාද ඊට ඉහළින්ම කැමති විය.

පසු දින ඔවුම්ගේ කිසිවෙකු පාසල් ගියේ නැත. ඒ තවත් සතියකින් එන විභාගය නිසා සියලුම විශයන් උගන්වා අවසන් වීම නිසත් පාසල් කාලය නිකරුනේ නාස්ති වෙන නිසාත් ය.

පසුදා උදයම අවදි වූ රොබට් නාන කාමරයට ගොස් මුහුන සෝදා දත් මැද පිරිසිදු වී ඇදුමක් ඇද තේ එකක් සහ කේක් කැබැල්ලක් සමග කොරිඩෝවට ගියේ පරිසර සුන්දරත්වය විදීමට ය

“ රොබට්... රොබට්... මෙන්න ඔයාට කෝල් එකක්! මම හිතන්නේ සෙල්ටර්.’’

මේ හදිස්සියේ සෙල්ටර් කතා  කරන්නේ ඇයි?

“හෙලෝ  සෙල්ටෙර් මො කෝ මේ එක පා රටම? මො කක් හරි අවුලක්ද?”

“ හෙලෝ  හෙලෝ  රොබට් මම මේ කියන දේ ඔයා  විශ්වා ස කරයිද දන්නේ නෑ..... ඔයා  දන්නවද අපේ ටෙස්ට් එක කල් ගිහින් ඔයාට හිත ගන්නවත් පුලුවන්ද??

හෙලෝ   හෙලෝ  රොබට්... ඔයා  ඉන්නවද???”

රොබට් දැන් සිටින්නේ ඉතාමත් කම්පනයෙනි...  මෙතරම් හිස රදයක් වූ විභාගය කල් ගිහින් ඇත.... මේ සතුට නම් උත්සවස්ශීයෙන් සමරන්න ඕනේ....

“හෙලෝ  හෙලෝ  මම ඉන්නවා  ඇත්තටම මට හිත ගන්න බැරි උනා .... අපිට හිසරදයක් වෙච්ච මේ විභාගේ කල් ගිහින්... සෙල්ටෙර් ඒක කවද්ද තියෙන්නේ දෙවියනේ? නොතිබ්බත් කමක් නෑ  ඒත් ඒක අනිවරෙන් දවසකසක තියෙනවා  ඒ කවද්ද?”

“මම හිතන්නේ මට ඇහුනු විදිහට මේ නොවැම්බර් නම් ඒක තියෙන්නේ දෙසැම්බර් අග ජනවාරි මුල වගේ.... කොහොම උනත් ඔයා කීව එක හරි අපිට එපා වෙච්චි මේඑ කරදරේ කල් ගිහින් අපි මේක ඩෙකර් ලගේ ගෙදර ගිහින්ම කතා  කර ගමු එහෙනම් මම තියන්නම් බායි’’

ඔහු  ඉක්මනින්ම මෙය තෝමස් මහත්මියට පවසා  සුවසේ ඒ දවස ගත කලේ ය

පසු දින උදෑසනම සූදනම් වී  ඩෙකර් ලාගෙ නිවසට පැමිනියේ ඉතාම සතුටිනි... ඩෙකර් සහ සියලු යහලුවන් දැනටමත් එහි ඇති බැවින් සියලු දෙනා  රොබට් ව පිලිගෙන කතා  බහක යෙදෙන්නට වූයේ ඩෙකර්ගේ අම්මාගේ කලූ කෝපි සන්ග්‍රාහාය අතර මැදය. එයින් රොබට් ට දැ න ගැනීමට හැකි වූයේ දැඩි සීතල නිසාත් ඉදිරියේදී වැඩි වන හිම පතනය නිසා පාසල් සියල්ල වසා  ඇති ලෙසත් ය.

පසු දින සතියේ වැඩි වන මේ සීතල පිලිබද සියලු දෙනාගේ කතා වට ලක් විය.

“ අනේ අපි අද හවසට් නැන්සි ග්‍රෝ  ගාර්ඩින් එකට යමු.අර එකේ තියෙනවා  පොකුනක් ඒක මාරම ලස්සනයි මම අහලා  තියෙනවා  ඒ පොකුනේ දුර්ලබ මල් පලැටියක් තිබුනලු ඒත් ඒ ගොඩාක් ඉස්සර ඒක අලුත් වැඩියා කරාට පස්සේ ඒක නෑ......හේයි අපිට එහෙදි අයිස්!’’

‘’තියඩෝ  !මේ සීතලේ අයිස් ක්‍රීම් කන්න ඔයාට පිස්සුද ඔය තියෙන පිස්සුව තවත් වැඩි වෙයි ඇ.... ඊට පස්සේ හැවින්! හැවින්! ගගා  අපි ලගට නම් එන්න එපා..’’සෙල්ටර් පැවසුවේ තරමක් තරහිනී.

'' එයි ඒක හොඳ අදහසක්! මේ පැත්තේ තියෙන හොඳම ගාර්ඩ්න් එක තමා නැන්සි ග්‍රෝ ගාර්ඩ්න් එක... අපිට පුලුවන් හවස තේ වෙලාවට එතනට ගිහින් පොඩ්ඩක් නිදහසේ කාලා බීලා එන්න. ඔයාලා මොකද කියන්නේ?" තරමක උද්‍යෝගයකින් ඔරිටෝ පැවසුවේ ය.

"ඒයි මේ ලගදිම චන්ද්‍රග්‍රහනයක් තියෙනවා . අපි එදාට යමු සමහර විට අපිට ඒක බලන්නත් පුලුවන්'' ඩෙකර් පැවසුවේ ය.

" ඔය හැම දේකටම කලින් අපි ඩෙකර් ගෙ අම්මගෙන් අහන්න ඕනේ ඒක. මොකද මේ සීත කාලෙ'' එසේ කීවේ නිල්ඩ් ය

"ඔව් ඔව් එතකොට ඩෙකර්ගෙ අම්මට පුලුවන් හොඳට හිතලා තීරනය කරන්න.'' නෙකාලෝ පැ වසීය.

තවත් මදකට පසු ඩෙකර් තම අම්මාගේ අවසරය ඉල්ලීය. මුලින්ම සියලු දෙනාගේ දෙමව්පිය අවසරය ඇතුලුව යන ලෙසත්, අවසරය දුන් හොත් හෙට යන ලෙසත් අම්මා පැ වසීය.

සියල්ලෝම නිවෙස් කරා ගොස් සිදු වූ සියල්ල දෙමාපියන්ට පවසා අවසරයත් ඇතුවත් ඩෙකර් ගේ නිවසට පසු දින පැමිනිය හ.

" රොබට්... මේ අහන්න. නැන්සි ග්‍රෝ ගා ර්ඩන් එක කියන්නේ ලස්සන ඒ වගේම අමුතු තැනක් අ..... හරි මොන දේ වුනත් පරිස්සමින් හොඳද ඔයා දන්නවනේ මම ඔයාව මෙහෙම තනියෙන් ටයවන පලවෙනි පාර හරිද ? හොදට මුල ඉදන් මතක් කරන්න...'' තෝමස් මහත්මිය මදක් තැකීමකින් කතා කලා ය.

"අම්මා මම යන්නේ ඩෙකර් ලගෙ දිහා අනික මොනවද මතක් කරන්නේ? මේක නිකම් ම නිකම් පුන්චි ට්‍රිප් එකක් වගේ''

''අහ් ඔව් මමත් මොනවා කියනවද දන්නේ නෑ හරි දැන් පරිස්සමින් යන්න.''

මද වේලාවකින් දෙදෙනාම ඩෙකර් ගේ නිවසට ලන් විය.

යහලුවන් සියල්ලෝම සෙමෙන් සෙමෙන් ග්‍රෝ වෙත ලගා විය. සියල්ලෝ ම, රැගෙන ආ රෙදි ආදිය එලා කෑ ම බීමත් සියල්ල අතුරා සතුටින් සිටිද්දී රොබට් පමනක් කිසියම් දෙයක් ගැන උනන්දුවක් දැක්වීය. කිසි දාක රොබට් ගේ මව මෙවැනි තේරුම් ගැනීමට නොහැකි දේ පවසන්නේ නැත. ''හොදට මුල් ඉදන් මතක් කරන්න'' මොකක්ද ඒකෙ තේරුම අනේ මන්දා ... මොනා උනත් දැන් යාලුවොත් එක්ක හොදට ඉන්න ඔනේ.

" හේයි රොබට් බලන්නකෝ මම ගෙනාපු දේ බ්ලැන්කට් දෙකක්. බලන්න මම ජෑම් බෝතල් දෙක තුනකුත් ගෙනාවා ඇයි ඉතිම් බැරි වෙලාවත් අර කැමේලියා මල් තිබ්බොත් පැලයක් ඇරන් යන්න ඕන තව මාලු දෙන්නෙක් විතර ඇරන් යන්නත් මම මේව ගෙනාවා'' තියඩෝ පැවසීය

සැවොම එක් වී ගෙනා කෑ ම සහ බීම අහාරයට ගෙන සෙල්ලම් කලහ. නොදැනීම සවස 6.00 ද පසු වී ඇත. උද්‍යානයේ සියල්ලෝම නිවෙස් කරා ගොස් ඇති බව ඔවුන්ට වැටහුනේ නැත. තවමත් යහලුවන් පිරිස සෙල්ලම් කරමින් විනෝද වෙමින් සිටී.

"ඒයි මේ අපි දැන් යමු නේද? අනික මට අද නිකම් මොකදෝ වගේ අනික අපෙ අම්මා අද මොනවදෝ කිව්වා මට, නිකම් පරිස්සම් වෙන්න කියලා ඕනිවට වඩා කීවා ඒක මට වුට්ටක් මොකදෝ වගේ'' රොබට් කීවේ මුහුනද මලවමිනි.

"අ..... මම හිතන්නේ රොබට් කීව එක හරි කලුවරත් වැටිලා ඉක්මනට, අනික හුලගකුත් එනවා නිකම් අමුතුවට... " නෙකාලෝ කීවේ අහස දෙස බලමිනි

සියල්ලෝම තම තමන්ගේ බඩු ලාස්ති කර ගත්තේ කලබලයෙනි. බඩු ලෑස්ති කර ගත් වහාම මොවුන් දුවන්නට වූයේ පරිසරේ ඇති වූ වෙනස් වීම් වලට ඇති වූ බිය නිසාමය.

“ ඒයි පොඩ්ඩක් ඉන්න අර අර... බලන්න අර පොකුනෙන් නිකම් අමුතු දෙයක් එනවා වගේ... මොකද්ද ඒ පොඩ්ඩක් ඉන්න ‘’ ඔරිටෝ පැවසුවේ තරමක් බියෙනි.

“ ඔව් බලන්න, මො කද්ද ඒ අමුතුයි ඒක ‘’ රොබට් පැවසීය

“ ඒයි ඒක පුපුරන්න හදන්නේ එන්න මෙතන හැන්ගිලා බලන් ඉමු’’ නිල්ටර් පවසීය.

මද වේලාවකට පසු පොකුනෙන් යමක් එලියට විසි වෙන්නට විය යන්තමින් එයින් එලියක් විහිදුනි. මේ අවස්තාවේදී චන්ද්‍රග්‍රහනයට බොහොම ලන් වී තිබුනි.

“ අපි බලමු ඒක මොකද්ද කියලා මට ඒ මොකද්ද කියලා දැන ගන්න ඕන’’ ඩෙකර් පැවසීය.

ළමුන් සියල්ලෝම එයට ලන් වී බැලීය පෙට්ටිය ඇතුලේ තිබූ දෙයින් සියල්ලෝම පුදුමයට පත් විය.

“ මොකක් මේ මලක් නේද පෙට්ටියක් මලක් පොකුනක් මොකක්! මොකක්ද මේකෙ තේරුම.’’ නෙකාලෝ පැවසීය.

“ හේයි........... මේ කැමේලියා (camellia) මලක් මම ඔයාල්ට කීව නේද වදවෙච්චි මල් පැලැටියක් ගැන ඒ මලක් තමා මේ.’’ තියඩෝ පැවසුවේ පුදුමයෙනි.

“ මොකක්!!!! හේයි මේ බලන්න ඒ මල යටින් එලියක් එනවා මම ඒක ඇරන් බලන්!!’’ සෙල්ටර් ට කියන්න හැකි වුනේ එපමනි. ළමුන් සියලු දෙනාම එක සැනින් අතුරුදහන් විය ඔවුන් සියල්ලෝම පෙට්ටිය තුලට විසි විය.

* *
*

“හේයි... අහ්.. මගෙ මගෙ ඔලුව...අ.... යාලුවනේ.... ඔයාලා කොහෙද?” ඩෙකර් පැවසුවේ හිස පිරිමදිමින් ය.

“හේයි මේ කොහෙද මේ මට මට ඇත්තටම හිතා ගන්නවත් බෑ ... හේයි මේක මහ පුදුමයක්... හිතන්න අපි මලක් එක්ක පෙට්ටියක් ඇතුලට ආවා . හිතන්න නිකම් ‘Fairy tale’ එකක් වගේ නෙවෙයිද?” රොබට් පැවසුවේ සිතා ගැනීමටවත් නොහැකිව වටපිට බලමිනි.

“අ... රොබට් ඇත්තටම අපි ඉන්නෙ කොහෙද?” සෙල්ටර් ඇසීය.

“ මේ අහන්න මම ඒක ගැන කියන්න කිසිම දෙයක් දන්නෙ නම් නෑ . ඒ වුනත් අපි දැන් ඉන්නේ පෘ තුවියේ කියලනම් මට සහතික කරන්න පුලුවන්. අපි ඉන්නේ කැලයක වගේ. මිනිස්සු නම් නෑ වගේ. හැ බැයිකොහේ හරි ඉන්නත් පුලුවන්. හරි මම කියන දේ හොදට අහගන්න කොහොමටවත් අද නම් අපට මෙහෙන් යන්න බෑ . මොකද අපි දැන් පෙට්ටියක ඉදලා මේ කොහෙටදෝ ආවා . කොහෙටද ආවෙ කියලවත් දන්නෙ නැතුව යන්න දගලන එක මහ මෝඩ වැඩක් කියලා මට හිතෙනවා . දැන් ගොඩක් රෑ වෙලා . මට මීඅතක හැටියට අපි මෙහෙට එනකොට ඒ කිව්වේ පෙට්ටියට එන්න කලින් මවෙලාව ගොඩක් රෑ වෙලා . මුලින්ම අපි අද රෑට ඉන්න තැනක් හොයා ගත්තොත් හොදයි ඉතුරු ටික අපි ඉන්න තැන ඉදන් කතා කරමු’’ රොබට් කීවෙ ය



යහලුවන් සියනල්ල එම කතාවට ඇහුම් කන් දී එය පිලිගතහ.සියලුම දෙනා වෙන්ව නොයා රාත්‍රිය ගත කිරීමට තැනක් සෙවීමට පටන් ගත් හ. මද වේලවකට පසු වාසනාව මොවුන් කරා පැමිනිය . විශාල ඕක් ගහක් මුල සාදුනු විශාල ගුහාවකි. එහි යහලුවන්ට සිටීමට හොදින් ම ඉඩ ඇත.මොවුන් ගුහාව දෙසට ටෝච් එලිය යොදා එහි අරක් ගත් සතුන් එයින් පලවා හැරුනි. පසුව මොවුන් රාත්‍රියේ සිටීම උදෙසා බෙනය සැකසීමට වඩ බෙදා ගත් හ.

රොබට් සහ නෙකාලෝ වනයට ගොස් ඔවුන්ට අව්ශ්‍ය දර හා දොරක් වැනි දෙයක් සැදීමට පොල් අතු පොලු වනි දේ ගෙනීමට ත් ඔරිටෝ සහ ඩෙකර් ජෑම් බෝතල් සදහා කනාමැදිරියෝ ඇල්ලීමටත් නිල්ටර් හා සෙල්ටෙර් බෙනය පිරිසිදු කිරීමටත් තියඩෝ රෑකෑම සකස් කිරීමටත් වැඩ බෙදා ගත් හ.

සත්තකින්ම මෙය දැන්නම් පුන්චි කූඩා රමක් වැනිය. එය වඩාත් ලස්සන වූයේ ජෑම් බෝතල් වලට හිල් විද එහි සිටින කනාමැදිරියන් විසිනි.එය මුලු බෙනයම ආලොකයෙන් චමිත්කාරයෙන් පුරවූවා පමනක් නොව ලමුන්ගේ විදුලි පන්කා වල බටරි ඉතිරි කිරීමටත් දායක විය. ඒ වගේම තියඩෝ ගේ පෙර පිනකට රැගෙන ආ බ්ලැන්කට්ටු දෙක ඔවුන්ගේ පුන්චි ඇද වන්නට වරම් ලැබීය.

ලමුන්ට මේ සිදු වූ දේ පිලිබඳ කතා කිරීමට අවැසි වුවත් මහන්සියත් සමග ඔවුන්ට බිලැන්කට්ටුවේ නින්ද ගියහ. නමුත් රොබට් ට නම් තවත් නිනද ගියේ නැත. සිදු වූ සැම දේම සිතා බැලියදී යම් කිසි දෙයක් සොය ගත නොහැකි වනු නොමැත. නමුත් ඒ දේ සිතීමට පෙරම නිනද රොබට් වත් වැලදගෙන තිබුනි.

පසු දා උදයම අවදි වූ යහලුවන් පිරිස ඉක්මනින් උදේ ආහාරය ලෙස ඩෙකර්ගේ අම්මා විසින් සාදනු ලැබූ සැන්ඩ්විච් ආහාරයට් ගෙන ඕක් නිවහනේ වටකුරු සාකච්චාවක යෙදුනි.

“ මට නම් මේ උන කිසිම දෙයක් හිතා ගන්නවත් බෑ අපි ඉන්නෙ කොහෙද කියලවත් අපිට දැන ගන්න තිබ්බනම්.... “ ඔරිටෝ පැවසීය.

“ ඔව් ඒක ඇත්ත එහෙම දැන ගන්න තිබුනනම් ගොඩක් හොදයි’’රොබට් පැවසු වේ දුකෙනි.

“ ඒ අර බලන්නකෝ අර අතන අර වැල් වලින් මොකද්දෝ එකක් වැගිලා. ගල් කැට දාන හදපු රාකයක්ද කොහෙදෝ . මේක හරිම අමුතු තැනක්, බල්න්නකෝ පොලොව හරිම සුමටයි. ඒ වගේම රවුම් රවුම් ගිහින් හරි මැද පොඩි රවුමක්

ලමුන් සියලු දෙනා යම් යම් කතා බහ වල යෙදෙන්නට විය. සියල්ලෝගේම ප්‍රශ්නය වූයේ සිටින තැන පිලිබදය.

“ හේයි මේ මේ අහන්නකෝ මට හොද අදහසක් ආවා . මේ අහන්න අපි ගිහින් අපි මෙහෙට ආපු තැන වුට්ටක් හෝදිසි කරොත් හෝඩුවාවක් හොයා ගන්න බැරි වෙන එකක් නෑ අඩුම අපි එතනට යන්කොට මෙහෙ ජීවත් වෙන කවුරුම හරි කෙනෙක් හොයා ගන්න බැරි වෙන එකක් නෑ .මේක කැලයක් වුනත්, ඔයාට මතකයි නේද රොබට් අර අපේ ඉතිහාසය පොතේ තිබ්බෙ මේ වෙනකොටත් කැලෑ වල මිනිස්සු ඉන්නවා කියලා .’’ තියඩෝ කීවේ ඉතාම සතුටිනි

“ වාව් තියඩෝ අපිට නිකමටවත් හිතුනේ නෑ නේ මේ වගේ දෙයක් ගැන අපි දැන්ම ගිහින් බලමු..’’ නිල්ටර් පැවසීය.

“මේක නම් අපේ වාසනාව ඊයෙ රෑ අපි මේ ඕක් ගහ ලගට එනකම් පාරෙ ගස් වල අතු නැමුවා අපි ඉන්න තැන හොයා ගන්න. අපිට ඒ අතු හරහා ගියොත් අපි වැටුනු තැනට යන්න හුගක් ලේසි වෙයි’’ නෙකාලෝ කීවේය.

ලමයින් හැමෝම නෙකාලෝට පින් සිද්ද වෙන්න නැමුනුගස් කොල දිගේ ගියේ ය. අන්තිමේදී ඔවුන් පැමිනියේ හරියටහිදුනු පොකුනු ගල් වලින් සැදූ ආසන ගල් වලින් සැදූ උලුවසු වැනි දේ ඇති තැනකටය. කලින් දා බොහෝ රෑ වී තිබුනු නිසා මේ කිසිවක් නොදුටු ලමුන් මේවා දැක ගොලු වී ඇත.එහි පාර දෙපස ගල් කුලුනු වැනි දේ වල යමක් සටහන් වී ඇති බව පෙනෙන් නට තිබුනි.

“ වාව් මේ දේවල් අපි කලින් දැක්කේ නැනේ... මට නම් හිතා ගන්නවත් බෑ .’’ රොබට් පැවසුවේ ඉතාම පුදුමයෙනි.

“ඔව්ව් ඒක තමා . මම නම් හිතන්නේ මෙහේ මිනිස්සු ඉදලා තියෙනවා . ඒ ගොඩාආආආආආආආආආආක් ඉස්සර කියලත් මට සහතික වෙන්න පුලුවන්...’’ තියඩෝ පැවසීය

“ කට්ටිය මේ බලන්න මේ ගල් කුලුනු වල එක එක ඒවා ඇදලා තියෙනවා . ඇයි ඇයි අර ඉතිහාසය වල තිබ්බෙ ගල් ගුහා චිත්‍ර එහෙම් කියලා’’ සෙල්ටර් කීවේ ය

“ මම නම් හිතන්නෙ නෑ මේව නිකම්ම නිකම් චිත්‍ර කියලා . මොකද ඒ චිත්‍ර එකින් එකට සම්බන්දයි වගේ.’’

ඩෙකර් පැවසූ දේ නිසා ලම්මුන් සියල්ල ඩෙකර් සිටින සිතානයට දුවගෙන ආවේය. මේ එන විට ඔරිටෝ අතින් ඔහුගේ පාදය හරියටම සමචතුරස්‍රා කාර ගලක්මත තියවුනි. මේ නිසා ලමුන් සියල්ලෝම පහලකට කඩා වැටුනි. හරියටම බැලුවහොත් ඔවුන් කලින් සිටගෙන සිටියේ ආදාරකයක් මතය.

ඔවුන් දැන් සිටින්නේ යම් පූජක ස්ථානයක් වැනි තැනකය.එයට සූර්‍යාලෝකය ඉහලින් පැමිනි විට මුලු ගුහාවම ආලෝකමත් වෙයි. ගල් ඇල්ලූ බිමක් සහිත මෙහි ඉදිරියෙන්ම මලකඩ කෑ යම් බාජනයක් විය. මෙම බාජනය දෙපස රජවරුන් වැනි විශාල යෝදයින්ගේ පිලිම ඇත යෝදයන් මත් නොව තරමක් විශාල පිලිමය. ඔටුනු පැලඳූ රජවරුන් ලෙස පෙනේ. එහි පිලිම වල පා අසල කුඩා පාරවල් හතරකි ඒවා එකම ස්ථානයකට එනම් අර බාජන තිබූ තැනට පහලට එක් වී ඇත. නමුත් කුඩා දිය පහරවල් දෙස පෙනුනද දිය නම් නොමැත.යහලුවන් ප්‍රවේශමෙන් ගොස් බාජනය එබිකම් කලහ. යම් ජලය වැනි ද්‍රාවනයක් එහි තිබුනි. එය ඇල්ලීමට පෙර වටපිට නිරීක්ශනය කල ඔවුන් ට අමුතු යමක් සොයා ගැනීමට හැකි විය. එහිත් ගල් පිලිම වල යම් යම් චිත්‍ර ඇඳ ඇති බව යහලුවන් දුටුවේය. එයින් ඔවුන්ට තේරුනේ අර බාජනයේ ඇති දිය එයට පහලින් ඇති ස්ථානයට දැමූ විට එක කුඩා දිය පාරවල් හතර ඔස්සේ ගොස් පිලිම හතරේ පය ගාවට වැටෙයි එයින් කිසියම් පනිවිඩයක් නිකුත් වී කවුරුන් හෝ එහි පැමිනෙන බව ගල් පිලිම වල සටහන් වී තිබේ. එන්නේ කවුරුද කියා නම් පැහැදිලි නොමැත.

මෙයින් සතුටට පත් යහලුවන් අන්තිම චිත්‍ර නොබලාම උදව් ලබා ගැනීමෙ අරමුනින් බාජනය වෙත ගියහ.

“ මේ අහන්න මේකෙන් මොකක් වෙයිද? ආයිමත් අපිව කොහෙන් හරි මතු වෙයිද? කියල අපි දන්නෙ නෑ මේකෙන් පනිවිඩේ ගිහින් කවුරු හරි ආවොත් අපිට ඉක්මනට මෙහෙන් යන්න පුලුවන් එයාගෙ උදව් ඇතුව. අපි මොනව කරත් හැමදේම එකට කරමු’’ රොබට් පැවසුවේ දැඩි විශ්වාසෙකින් ය.

“ ඔව් ඒක ඇත්ත මම නම් හිතන්නෙ අපි මේ කරන දේ හරි. හිතන්නකෝ , අපි මේ කොහෙටදෝ එක පාරටම ඇවිත් කිසිම අමාරුවක් නැතිව ඊයෙ රෑ ගත කරන්න බෙනයක් හම්බුනා . අපි වැටුනු තැනේදී ඔරිටෝට පින් සිද්ද වෙන්න මේක ඇතුලට වැටුනා මේ චිත්‍ර වලින් අපිට කවුරු හරි ගැන පෙන්නනවා . මේ හැමදේම වෙලත් අපි හොදින් මේක අපේ වසනාවෙම කොටසක් වෙන්න පුලුවන් ඒ නිසා අපි මේක කරමු.’’ තියඩෝ ද පැවසීය.

කිසියම් බියකින් සිටියද ඩෙකර් ඇතුලු අනිත් පිරිසත් තියඩෝ ගේ කතාව ඇසීමෙන් සන්සුන් වී සූදානම් විය.

මද වේලාවකින් මොවුන් බාජනය ගෙන පහල තිබෙන ස්ථානයට සෙමින් වත් කලහ. සෙමෙන් සෙමෙන් එය පිරුනි පිරී කුඩා දිය පහරවල් හතරට බෙදුනි. පුදුමයකි! කුඩාදිය පහරවල් වලට බෙදුනු ජලය වර්න සතරකි වම් පසින් තිබූ පලමු දිය පහර ලා නිල් පැහැයක් ද අනෙක දිලිසෙන කහ පාටක්ද මාජන තිබූ ස්ථානයට පකුනු පසින් තිබූ පලමු දිය පහර තැබිලි පාටක් ද අනෙක කොල පාටක්ද ගෙනය. ලමුන්ට මෙය සිතා ගැනීමට නොහැකිය.එකම පැහැයෙන් විනිවිද පෙනෙන්නට් තිබූ ජලය දැන් පාටවල් සතරකි. දිය පහරවල් දිගේ ගිය ජලය පිලිම සතෙරෙහි දෙපතුල් ගාවට ගොස් නැවතිනි. තවත් පුදුමයකි. නිල් පැහැ ජල පහර ගොස් නැවතුනු පිලිමය නිල් පාටින් ද අනෙක කහ පාටින්ද අනෙක් තැබිලි පාටින්ද අනෙක කොල පාටින්ද යට සිට ඉහලට වර්න ගැන්විනි. මෙය නම් අදහ ගැනීමට නොහැකිය. මද වේලාවකින් පිලිම සතර පන අවුත් සෙලවෙන්නට විය.

ලමුන් ගොස් ඉක්මනින් ගල් කනුවක සගවිනි හරි ආකාරයෙන් නොපෙනුනද යම් ආකාරයේ එලි සතරකින් සමන්විත විශාල රජවරුන් හතරකගේ කටහඩවල් ඇසේ . එකිනෙකට එකක් වෙනස් පැහැදිලි කට හඩවල් ය. බලා සිටීමට නොහැකි තැන ලමුන් පිලිම සතර ඉදිරියට ආවෝය.

ලමුන් පිරිස ගල් ගැසී මෙන් ඔවුන් දිහා බලා ඉන්නට විය.

“කවුද ඔයාල ඇයි ඔයාලා අපිව කැදවව්වේ. මොකක්ද ඔයාලට ඕන.’’ එක් පිලිමයක් විමසීය.

පලමුවැන්නා ලා නිල් පැහැයෙන් දිස්වෙයි. ඔටුන්නක් වැනි දෙයක් පැලදි සිටි. එහි හිම පියල්ලක ලාන්ජනයක් තිබේ. ඔහු තනිකරම නිල් පැහැති ය.

අනෙක් කෙනා තනිකරම කහ පැහැතිය. ඔහුද ඔටුන්නක් පැලද සිටී.ඔහුගේ ඔටුන්නේ හිරුගේ ලාන්ජනයක් ඇත.

තුන් වැනි කෙනා තැබිලි පැහැයෙන් දිස් වේ. ඔහුගේ ඔටුන්නේ තැබිලි පැහැති මේපල් ජොලයක් හැඩැති ලාන්ජනයකි.

සිව් වැන්නා  කොල පැහැතිය ඔහුගේ ඔටුන්නේ දලු ලන ගසක ලාන්ජනයකි.

ළමයින්ට තවමත් සිතා  ගැනීමට නොහැකිය. මෙලෙස බලා සිටීමට නොහැකිව රොබට් මුලින්ම කතා කරන්නට විය.

" ඇත්තටම අපි දන්නේ නෑ  ඔයාලා  කවුද කියලා . මේ ගල් කුලුනු වල තිබ්බ චිත්‍ර අපිට පුලුවන් විදිහට තේරුම් ගෙන මෙන්න මේ බාජනයේ තිබුනු වතුර මෙතෙන්නට දැම්මා ඊට පස්සේ උනේ මේ දිය පහර වල් අද්දිගේ ගිහින් ඔයාලගේ පිලිම ලග ඇවිත් ඔයාලට පන ආවා."

" ඔයාලා ඇත්තටම මේ කරලා  තියෙන වැඩේ බරපතල කම ගැන දන්නවද?ඇයි ඔයාලා අනිත් චිත්‍ර බැලුවේ නැද්ද? මේ මේ බලන්න ඒකේ තියෙන්නේ මහා විනාශයක් ගැන." ලා නිල් පැහැ  රජු කීවේය.

" හරි දැන් අපි මෙතන ඉදලා හරියන්නේ නෑ . මෙතන හිටියොත් වෙන කරදර දෙගුන වෙඉ. ඒ නිසා අපි ඉක්මනට යමු." කහ පැහැති රජු කීවේ ය.

ළමයින් සත් දෙනා වට කරගත් රජ වරු සතර දෙනා  ඔවුන්ගේ අත් පටලාගෙන යමක් මුමුනන්නට විය. එක් සැනයකින් ඔවුන් ඕක් නිවසින් මතු විය. ළමයින් කිසිම දෙයක් සිතා ගැනීමට අපහසුය. නමුත් රජවරු සිව් දෙනා කලබලයෙන් හැසිරෙන වගක් පෙනෙන්නට විය.

" අපි නැති කාලෙ කවුරුහරි මෙහෙ ඉදලා තියෙනවා.. ඒත් පලපුරුදු අය නම් නෙවෙයි" එක් පිලිමයක් පැවසීය.

" සමාවෙන්න අපි තමයි මෙහෙ ඉන්නේ. ඇත්තටම කිව්වොත් ඊයේ රෑ ඉදන්. අපි මෙතනට එනකොට නම් කවුරුත් මෙහෙ හිටියේ නෑ.'' සෙල්ටර් පැවසීය.

" මොකක් ඔයාල ඊයෙ රෑ ඉදන් මෙතන හිටියනම් කොහොමද ඔයාලා  Locked palace එක ගැන දන්නේ "

" අ… මම හිතන්නේ මේ රජවරුන්ට අපේ කතාව කීවොත් හරි" නිල්ටර් පැවසුවේ බිම හිද ගනිමින් ය.

මද වේලාවකට පසු රජවරුත් යහලුවනුත් බිම හිදගෙන යහලුවන්ගේ කතාව ඇසීමට පටන් ගත් හ. තියඩෝ කතාවට මුල පිරුවේය.

"ඇත්තටම අපි මේ කාලෙ නෙවෙයි. අපි අපේ කාලෙ ඉන්නකොට අපි හවසට පොඩ්ඩක් නැන්සි ග්‍රෝ  පා ක් එකට ගියා. එදා චන්ද්‍රග්‍රහන දවසක් අපි එහෙට ගිහින් ටික වෙලාවකින් හැමෝම ගෙවල් වලට ගිහින් තිබුනා . ඉතින් අපිත් යන්න යනකොට එතන තිබුනු පොන්ඩ් එකෙන් මොකක් හරි දෙයක් එනව දැක්කා  බලනකොට පෙට්ටියක් ඒකේ ඇතුලේ ලස්සන මලක් තිබ්බා.. මොකක්ද??? අහ්! කැමේලියා වර්ගෙ මලක්. ඉතින් ඒකෙ යටින් එලියක් එනව දැක්කා ඊට පස්සෙ අපි අතුරුදහන් වෙලා  මෙහෙට ආවා  . එදා අපි රෑට ඉන්න තැනක් හොයනකොට තමා මේ ඕක් බෙනේ දැක්කේ ඉතින් අපි ඒක අස් කරලා  ගත්තා. ඉතින් පහුවදා , අපි වැටුනු තැන බලන්න ගියාම තමා  අර අමුතු තැන තමයි අපි හිටියෙ කියලා  දැක්කේ."

මෙයට හොදින් සවන් දුන් රජ වරුන්ගෙන් නිල් පැහැ කෙනා  කතා කරන්නට විය.

" අපිට තේරුනා , මුලින් ඔයාලා කරපු දේ ගැන කියන්න ඉස්සර වෙලා  අපි කවුද කියලා  කියන්න කැමති. ඇත්තටම අපි තමයි සෘ තු හතරේ ප්‍රදාන වරු. මගෙ නම Winter. එතකොට කහ පාට කෙනා  Summer තැබිලි පාට කෙනා  Autumn කොල පාට කෙනා  Spring. අපි හතර දෙනාගෙ නම් වලින් තමා  සෘ තු හතර නම් කෙරෙන්නේ. එතකොට අපි හතර දෙනාටත් ප්‍රදානියෙක් ඉන්නවා . එයා තමා  God of season."

මේ අතරේ රොබට් ට යමක් සිහියට නැගුනි. මේ නම් අහලා පුරුදු ඒවා යැයි රොබට් ට හැගුනි.

“ඉතින් ඇත්තටම කිව්වොත් කාලෙකට ඉස්සර මේ ඕක් බෙනය තමයි අපේ මූලස්ථානය වුනේ. ඒත් එක දවසකට පස්සේ අපි හැමදාටම Locked palace එකේ හිර වුනා. ඇත්තටම කිව්වොත් එක දවස් මේ වගේ අපි හතතර දෙනාම එක පාරට මෙහෙට් කැදවව්වා . ඒ කැදෙව්වේ කැමේලියා කියලා ලමයෙක්. ඒකෙන් අපි හතර දෙනාගෙම බලය ක්‍රියාත්මක වුනා. ඒ කිව්වේ හිම පතනය දැඩි අව්ව කොල හැලෙනවා ආයෙත් හට ගන්නවා . ලෝකයේ සමතුලිතතා වය බිදුනා . ඉතින් God of season ඉක්මනට ඒක නතර කලා . ඊට පස්සෙ ඒ වැරැද්ද කරපු කැමේලියාව කන්දක් මුදුනේ හිර කලා . ඊට පස්සේ උන දේවල් නම් අපි දන්නෙ නෑ. ඉතින් එදා එයා අපිව කැදවන්න ගත්තු බෙහෙත් වට්ටෝරුවෙන් ඉතුරු ටිකයි අපිවයි එතන පරිස්සමින් පිලිම බවටGod of season පත් කලා. ඉතින් දැන් ඔයාලා ඒක ආයෙමත් ක්‍රියාත්මක කාලා. ඒත් අපි විතරයි ආවේ අපේ බලයන් ආවේ නෑ . ‘’ සමර් කීවේය.

එක් වරම රොබට් ට මේ සිද්දීන් එක්ක මතක් වූයේ ඔහුගේ අම්මාගේ කතා ය. ඔහුට සිතුනේ ඔවුන් කතාන්දරක් තුලට ඇවිත් ඇති බවය. නමුත් ඔහුගේ සැකය අඩු වුනේ නැති වූයේ මේ සෑම දෙයක්ම අම්මා දැන ගත්තේ කෙසේද වූ නිසාය.

“ එතකොට කැමේලියා ඔයාලව කැදවපු වෙලාවේ මුලු ලෝකෙම සමතුලිතතාවය නැති උන නම් දැනුත් එහෙමම වෙන්න ඕනෙ නේද?” නෙකාලෝ පැවසීය.

“ ඔව් ඇත්තටම එදායින් පස්සෙ God of season ආයිමත් මේ වගේ දෙයක් උනොත් වෙන විනාශය පරක්කු කරන්න ක්‍රම වෙදයක් යෙදුවා. ඒ තමයි අපි එකම තැනින් මතු උනාට අපේ බලයන් මේ වෙනකොටත් ලෝකයේ හතර තැනකින් පටන් ගෙන ඇති ඒක පැතිරෙනවා . අපි හතර දෙනාගෙම බලය වැඩී මොකද දැඩි අව්වෙන් ගින්නක් ඇති වෙන්න පුලුවන්. දැඩි සීතල නිසා වතුර අයිස් වෙනවා ග්ලැසියර වැඩි වෙනවා හිම පතනය වැඩි වෙලා මිනිසුන් ට ජීවත් වෙන්න බැරි වෙනවා. හිතන්න අසීමිතව ගස් කොලන් වල දලු දානවා ඉක්මනට ඒවා වැඩෙනවා. අනික් පැත්තෙන් ඒ හැම එකකම කොල හැලෙනවා . God of season දැන් ලෝකයේ හතර පැත්තෙන් එන අපේ බලය කොහොම හරි වෙලාවක එකට වෙනවා අපෙ බලයන් හතර එකට උනොත් ලෝකය බේරගන්න බැරි වෙයි. අපි ඒ බලයන් හතර එකට වෙන්න කලින් අපි God of season ව හොයාගන්න ඕන හොයා ගෙන මේක නවත්තන්න ඕන. දැනටමත් ඔයාලගෙ කාලෙ චන්ද්‍රග්‍රහනය වෙන ගමන් නම් දැනටමත් අපි හතර දෙනා කැදවලා ඉන්නේ කියලා චන්ද්‍රයා දන්නව ඇති.’’ ඕටම් කීය.

“ අපි හෙටම ගෝඩ් ඔෆ් සීසන් ව හම්බෙන්න යන්න ඕන.හෙටම ලෑස්ති වෙන්න.’’ ස්ප්‍රින්ග් කීවෙ ස්ථිර කර ගනිමින් ය.

සැමගෙම සිත් තුල අදිශ්ටානයක් හා බියක් ද ඇත. කුමක හෝ දෙයකින් ඔවුන් ප්‍රමාද වුවහොත් ලෝකයවිනාශ වී යයි. නැවත ඔවුන්ට් කිසි දා සමාවක් නම් නැත. මිනිසුන් අනන්තයකගේ ජීවිත විනාශ කර යාමට නියමිත අපා යේ ප්‍රවේශපත්‍ර මොවුන් වෙනුවෙන් දැනටමත් ව්වෘ තව ඇතැයි ඔවුන් සිතමින් . නිදා ගැනීමට ගියහ.

“ හේයි පොඩ්ඩක් ඉන්න. දැන් ඔයාලත් එනවද අපිත් එක්ක නිදා ගන්න. සෘ තු අපිත් එක්ක් නිදා ගන්නවා . ඒක නම් පිස්සුවක්.’’ සෙල්ටර් කීවේ සිනා සෙමිනි.

“ ඔයාට පිස්සුද? ඔයාලා අහලා තියෙනවද සෘ තුවක් ලමයි එක්ක නිදා ගන්නවා ? දැන් එහෙනම් ගිහින් නිදා ගන්න බිම්මල.’’ වින්ටර් කීය.

සෙල්ටර් පුදුම වී ඔවුන් දෙස බලා සිටියේ තමාගෙ අන්වර්ත නාමය ඔවුන්ට කීවෙ කවුද කියා සිතමින් ය.

මද වේලාවකින් සෘ තු හතර එක පේලියකට සිට ගෙන දෑත් දෙක හරස් කර පපුව ඉදිරියට ගෙන සිටියහ.එක් වරම ඔවුන්ගෙන් ඔවුන්ට ආවෙනික එලියන් විහිදෙන්නට විය. හරස් කර ගත් දෑත් විහිදුවමින් සෘ තුවට අදාල නම කියමින් තමන්ගේ ලාන්ජනය ඇද අතුරුදහන් විය.

“ වින්ටර්.....”

“ සමර්.....”

“ඕටම්.....”

“ස්ප්‍රින්ග්.....”

ඔවුන් ඉබේටම නොපෙනී ගියහ. ලමුන්ටනම් මෙය මහත් පුදුමයකි. කෙසේ හෝ ඔවුන්ද ඉදිරියට කිරීමට ඇති වැඩ ගැන සිතමින් නින්දට ගියහ.

පසු දින උදෑසනම අවදි වන විට ඍතු හතරම ඇවිත් තිබුනි. ඔවුන්ට යැමට තිබුනේ ගොඩ් ඔෆ් සීසන් ලගටය.

මුලින්ම සියලු දෙන ලොක්ඩ් පැලස් වෙත ගොස් එහි තිබූ බාජනයද රැගෙන ගමන යාමට පිටත් වුනි. ඍතු හතරට ගොඩ් ඔෆ් සීසන් ලගට යාමට උපරිම හැකියාව තිබේ යැයි සිතූ ලමුන් මෙල්ස කීය.

“ ඇයි ඔයාලා කෙලින්ම ගෝඩ් ගෝඩ් අහ්! ගෝඩ් ඔෆ් සීසන් ලගට නොයන්නෙ. ඔයාලා ට පුලුවන් නෙ නැතිවෙලා ඉබේටම මතු වෙන්න.” පැනය ඉදිරිපත් කලේ රොබට් ය.

“ ඔව් ඔයාලා කියන එක හරි. ඒත් අපි දැන් දන්නේ නෑ දැන් කොහෙද එතුමා ඉන්නේ කියලා . ඇත්තටම අර සිද්දියෙන් පස්සේ එතුමා දිගටම රහසිගතව වැඩ කරන්න තීරනය කලා. මොකද දැන් චන්ද්‍රයා හිතන්නේ එතුමා තමා චන්ද්‍රයා ව විහිලුවට ඇරන් ඍතු හතරම ක වර කැදවව්වේ කියලා. “ ඕටම් කීය.

“ ඒ වගේම ගෝඩ් ඔෆ් සීසන් අපි ගැන හිතලා තමා කාත් එක්කවත් ඇයි හොදැයියක් නොපවත්වාම රහසෙම ජීවත් වෙන්නේ. මොකද මේ කාලෙ හැටියට ඍතු හතරම ඇති වෙන්නේ චන්ද්‍රයාගේ බලපෑමෙන්. බැරි වෙලාවත් චන්ද්‍රයාට තරහ ගියොත් සමහර විට මේ අපේ අන්තිම හමු වීම වෙයි.” වින්ටර් කීවේ දුකින.

“හරි ඉතිම් අපි යමු” තියඩෝර් කීවේ විමසිලිමත්ව ය.

මේ වන විටත් ගෝඩ් ඔෆ් සීසන් රහසිගතව ජීවත් වන නිසා යාමට සිදු වන්නේ කොහේද කියා කිසිවක් දන්නේ නැතිව සියලු දෙනා කල්පනා කරන්නට විය.

“ හේයි වින්ටර් ඔයාට මතකට මේ ඕක් ගහ අපේ මූලස්තානය වුන දවස් වල අපිට පනිවිඩ ලබා ගන්න අපි අපේ බලයන් එකතු කරලා පලිගු කට හතරක් හැදුවා. අපේ බල හතරම එකතු වෙලා තමා ගෝඩ් ඔෆ් සීසන්ගේ බලය හැදෙන්නේ. “ ඕටම් හඩ නැගීය.

“ ඔව් ඒක හරි සමහර විට ඒක වැඩ කරන්න පුලුවන්. මේ විශාල ඕක් ගහේ කොහෙම හරි ඒ සලකුන ඇති හැමෝම හොයමු.” වින්ටර් කී පසු හැමෝම බලාපොරොත්තො අතැතිව සොයන්නට විය.

පැයකට ආසන්න වේලාවක් ගත වුවද මොවුනට කිසිදු දෙයක් සොය ගත නොහැකි විය.. බලාපොරොත්තො සියල්ල සුන් වී ගිය මොවුන් පසෙකට වී වාඩි විය. රොබට් මෙය ගැන සිතමින් යහලුවන් ගෙන් ඈතට ගොස් කල්පනා කරන්නට විය. බිම වාඩි වූ මොහුට යම් අපහසුවක් දැන්නට පටන් ගැනුනු නිසා පසු පස හැරී බලන්නට විය. එහි යම් දෙයක් තැබීමට තරම් අච්චුවකි. එය ඉතා කුඩා සීනුවක හැඩය ගනී. රොබට් හට මෙය වටහා ගැනීමට නොහැකි විය. මියී කෙතරම් අනර්ග කැටයමක් ද මොහු සිතමින් අනෙක් අයට මෙය පවසන්නට යන්නට තැත් කිරීමේදී ඔහුගේ සාක්කුවෙන් යමක්

බිමට වැටුනි. ඉතා සියුම් ශබ්දයක් වුවද එම ශබ්දය විදුලි සැරයක් යන්නා මෙන් රොබට් ට ත්දින්ම දැනුනි. ඔහු නැවත හැරී බිම වැලුවේය. පුදුමයකි! එය නැගනියගේ ටින්කබෙල් සීනුවයි..... එම සීනුව ඉබේම සාක්කුවට ආවාද නැත්තම් එය මුල සිට තිබුනාද රොබට් දන්නේ නැත. රොබ්ට් එය අතට ඇරගෙන

“ ටින්කබෙල් “

“ ටින්කබෙල් ඔයා කොහෙන්ද මෙතනට ආවේ”

යනුවෙන් මුමුනන්නට විය. එක් වරම අර කැටයමෙන් දිස්නයක් මතු වුනි රොබට් ටින්කබෙල් සිනුව එය මත තැබූ පමාව පමනි. එක් වරම මුලු ඕක් ගසම තද එලියකින් දිස් වෙන්නට විය. මුලු ඕක් බෙනයම ලා වර්න හතරකට බෙදුනි.. එනම් නිල් කහ තැඹිලි හා කොල යන්නයි.

එක් වරම සෘ තු හතරට අදාලව පලිගු කැටයම් ද එයින් මතු වුනි. සියලු දෙනාට අදහා ගත නොහැකි විය. මෙය වූයේ කෙසේද කියා ඇසීමට පෙරත් ඒවා ස්වංක්‍රීයව ක්‍රියාත්මක විය. ඕක් ගස මැද රවුමක් කැඩී ඉහලට විත් මේසයක් මෙන් සැකසිනි. එහි ඇත්තේ වීදුරු මෙසයක් වැනි දෙයකි. එත් වරම සෘතු හතරේ ප්‍රදානියන් එතනට විත් වුන්ගේ අත් එය මත තබා යමක් මුමුනන්නට විය.

“ අපට මග පෙන්වනු //”

“ වේක්වුඩ්.... “

‘’වේක්වුඩ් කියන්නේ මොකද්ද‘’ හැමෝගෙම ප්‍රශ්නය විය. නමුත් කිසිත් නොකියා සියලුම දෙනා සද්ද නැතිව මෙය දෙස බලා සිටින්නට විය.

“ එන්න අපි හැමෝමයි මෙය කරන්න ඔනේ. ඇවිත් අපිව අල්ලගන්න.’’ වින්ටර් කීවේය.සියලු දෙනා ගොස් ඔවුන්ගේ පිටුපසින් අල්ලන් දැස් පියා කුමක් වේදෝ බලා සිටින්නට විය.

එක් සැනින් මොවුන්ට ඇගට යම් අපහසුවක් දැනෙන්නට විය ඇග ඇදෙන ස්වාබාවක් දැනෙන්නට පටන් ගෙන තිබුනද කිසිවෙක් ඇස් නොඇර තදි අල්ලන් සිටියහ.

එක් වරම මොවුන් සීතලින් පිරුනු ප්‍රදේශයකට වැටුනි. සියල්ලෝම විශ්මය ජනක ලෙස බලා සිටින්නට වූහ.

එනම් එහි සීතලට හිම පතනය වෙමින් තිබුනද පොලොව මත අමාරුවෙන් වැඩෙන ආ පාට මල් ද විය. ගස් කොලන් කොල පාටය සමහර ගස් වල කොල හැල්වමින් තිබුනි. පුදුමසහගත දේ නම් විනාඩි දෙකකට ගසක් බැගින් රෝපනය වී ඒවාගෙ කොල ගැලවී ආයෙමත් වරදනය වෙයි. මෙය නම් සිතා ගත නොහැකි සිද්දියකි.

“ ඕහ් අපි පරක්කු වැඩී ලමයිනේ.. දැනටමත් ඒක පටන් ඇරන්” ඕටම්න් කීය.

“ අපි මේ කොහෙද ඉන්නෙ “ඕරිටෝ ඇසීය

“ මොකද්ද මේ වෙන්නේ” ඩෙකර් ඇසීය

“ අපේ සෘ තුන් එකම වෙලාවෙ ඇවිත්. අපි මේ ඇවිත් ඉන්නෙ. වේක්වුඩ්.... ඒ කියන්නේ චන්ද්‍රයාගෙත් ගෝඩ් ඔෆ් සීසන්ගෙත් මූලස්තානය. අපි නිකමට හිතුවා ගෝඩ් ඔෆ් සීසන් මෙහෙ ඉන්න වා ඇති කියලා. ඒ වගේම ඔහු ඉන්නවා. ඒක අපිට දැනෙනවා..” විනටර් කීය

“ අපි දැන් කොහොමද එතුමාව හොයා ගන්නේ ‘’ රොබට් කීය.

ඔවුන් ඉදිරියට ඇදෙන්නට විය. අදික සීතල ත් රස්නියත් එකතු වීමෙන් ලමයින්ට බොහෝ අපහසුවක් දැනෙන්නට විය. තු සතරටද තමන්ගේ බලයන්ගේ විරුද්ද බලයන් මේ වන විට පවතින නිසා යම් අපහසුවක් තිබුනද මොබවුන් එය ඉවසා සිටියහ. ලමුන්ට දරා ගැනීමට නොහැකි තරම් කාලගුනය වෙනස් වෙන්නට පටන් ගැනුනි. ඔවුන් වෙතට පැමොනෙන අයිස් කුනාටු වලින් මිදී සිටීමට වින්ටර් හට පුලුවන් වුවද ඒවා නැවැත්වීමට ඔවුන්ට නොහැකි විය. ඔවුන් පය තබන තැන ගැනද විමසිලිමත් වීමට සිදු වූයේ කොතෙනින් ගසක් මතු වේද නොදන්නා නිසා . ඒ වගේම ගසක් කොල සැලී ඒ ගස මොන අවස්තාවේ කඩා වැටෙයිද යන බියත් දැඩි රස්නිය නිසා ඇති වන ගිනි ගැනීම් ගැනත් අවිශ්වාසෙන් මොවුන් ඉදිරියට ඇදෙන්නට විය.

වැඩි වෙලා යාමට පෙර මොවුන් යම් දොරටුවක් අසලට පැමිනියේය. මෙයින් ඇතුල් වූ මොවුන් ට කිසිදු දෙයක් දැක ගැනීනමට ඔහැකි වුවත් ඉදිරියේ රන් ආසනයක් පෙනෙන්නට තිබුනි. එක් වරම

“ වින්ටර් , සමර් , ඕටමින් , ස්ප්‍රින්ග් “

යනුවෙන් කටහඩක් ඇසෙන්නට විය. සැවොම වට පිට බැලූහ. එක් වරම රන් ආසනය මත නිල් කහ තැබිලි හා කොල පැහැවලින් මිශ්‍ර සාලුවක් හා කඩුවක් සමග තරමක් වයස් ගත පුද්ගලයෙක් එහි හිද සිටියේ ය. ඔහුව දුටු සැනින් සෘ තු හතර එක් කකුලක් නවා දනිස් බිම තිය ඔහුට ආචාර කරන්නට විය.

“ ගෝඩ් ඔෆ් සීසන්.. අපට ඔබව මුන ගැසුනු එක කොච්චර හොදද .. “ වින්ටර් කාරුනිකව කීය.

“ ඔව් වින්ටර් ඒත් අපි මේ වෙන්න යන විනාශා නවත්වන්න ඔනේ. ඔයාලා මේ දකින්නේ ඇත්තටම වුන දේ නෙවෙයි මම මගේ බලයන් වලින් මේක පාලය කරලා තියෙන්නේ. ඇත්තටම් මීට කලින් මෙතන ගින්නක් තවත්ගස් කොල හිම ගොඩක් තිබ්බා . මට නම් තවත් මේක දරාන ඉන්න බෑ .

කියූ ගෝඩ් ඔෆ් සීසන් ආසනොයන් නැගිටියේ බොහෝ අපහසුවෙන් ය. ඔහු ගේ සියලුම බලයන් මෙයට වැය වී යන බව පෙනේ. ඔහු විදින් විඩේ නොපෙනී යයි. එනම් ඔහුගේ බලය වැය වන බවය.

“ එතකොට කවුද මේ කට්ටිය. මොනවද මේ ඇදන් ඉන්නේ” ගෝඩ් ඔෆ් සීසන් විමසනවාත් සමගම ස්ප්‍රින්ග් කතාව විස්තර කරන්නට විය. සියල්ල තේරුම් ගෝඩ් ඔෆ් සීසන් මෙසේ කීය.

“ ලමයිනේ මේ වෙන්න යන විනාශය ඒ කියන්නෙ විසර් එක, සෘ තු හතරක් එකට එක් වීම තමා විසර් කියන්නේ. මේක හරියට ලෝකය හතරකට බෙදිලා සෘ තු වලට බෙදිලා ඒව පැතිරෙනවා. ඒ විතරක් නෙවෙයි බලයත් වැඩි වෙනවා. මේ හතර එකට එකතු වෙන්න කලින් අපි මේක නවත්තන්න ඕනෙ නැත්තම් ඔයාලට සදහටම මෙහෙ ඉන්න වෙනවා “ ගෝඩ් ඔෆ් සීසන් දුකින් කීය.

ලමුන් සියලු දෙනා තිගැස්සී ගියහ.

මද වේලාවකින් මොවුන්ට මේ දේශ්ගුනය තවත් දරා ගැනීනමට නොහැකි තත්වයට පත් විය.

“ එන්න සීසන්ස් අපි මේක නවත්තමු……………..” ගෝඩ් ඔෆ් සීසන් අමාරුවෙන් වුවත් මෙයට එකතු විය.

ඉන් පසු සීසන්ස් හා ගෝඩ් ඔෆ් සීසන් එක් වී දොරටුවෙන් පිට ගියහ. මොහොතකින් සීසන්ස් හට යම් අපසුවක් දැනෙන්නට වූයේ මුලු ලෝකයේම තමන්ගේ බලය විහිදී ඇති නිසාත් විරුද්ද බලයන් සමග සිටීමට වැඩි බලයක් වැය වන නිසාත් මොවුන්ට එය දරා ගත නොහැකි විය. ගෝඩ් ඔෆ් සීසන්ගේ දෙපැත්තට දෙදෙනා බැගින් මොවුන් විහිදුනි. එක් වරම මොවුන් දැඩි අපහසුවකින් තමන්ගේ බලයන් තමන් හට උරා ගැනීමට පටන් ගථ. මෙය ඔවුන්ට අපහසු කායීක් විය. ලමුන්ගේ ආරක්ශාව තකා මොවුන් ඔවුන්ට ආරක්ශක පලිහක්ද නිර්මානය කර දුනහ. දිගින් දිගටම සීසන්ස් මෙහි නිරත විය. ඔවුන්ගේ බලයන් එකිනෙකට ගට්ටනය වීමට පෙර මෙය නැවැත්විය යුතු යැයි සිතා මොවුන් තමන්ගේ උපරිම ශක්තිය යොදා බලයන් ඇදගත් හ.



අවසානයේ ගෝඩ් ඔෆ් සීසන් මැද සිට තමාගේ කඩුව රැගෙන හයියෙන් පොලොවට ගැසීය. එක් වරම සුදු එළියක් සමගම ශබ්ද සියල නැවතෙන්නට විය. දොරටුවේ කෑලි ගැලවී පාවුනි. ලමයින්ද පාවෙන සේ දැනුනි. මුලු ලෝකයම තත්පරයක් නැවතී නැවතත්පටන් ගැනුනාක් මෙන් දැනෙන්නට විය.

එක් වරම සුදු එළිය නැති විය. රොබට් හා ඔහුගේ යහලුවන් දෑස් විවර කරන්න ට විය. සියලු දේ විනාශ් වී ඇත . ඔවුන්ගේ ආරක්ශක පලිහද නැත. පුදුමයකී මපරිසරය නිස්කලංකය. හිම වත් කොලවත් අදික ලෙස තතාත් අදික රස්නයත් නැත. වෙනදා මෙන් සාමාන්‍ය ආකාරයෙන් ඇත.

රොබට් හා යාලුවෝ පිරිස දුවගෙන් දොරටුව තිබූ තැනින් එළියට ගියහ.

“ යේ අපි කොහොම හරි ඒක කලා ……….. දැන් අපට ගෙදර යන්න පුලුවන්…..” නෙකාලෝ සතුටින් කෑගසන්න්නට විය.

නමුත් සීසන්ස් බිම වාඩි වී රවුමට සිටියහ. ලමුන් සියන්න එත්නට ගොස් විමසිලි කරන්නට විය.

“ ඇයි මේ අපි සතුටු වෙන්න ඕනෙ. කොයි ගෝඩ් ඔෆ් සීසන්” සෙල්ටර් ඇසීය.

“ මිහ! ඔහු අපි අතරින් සමු ගෙන!!!”

සම්ම් කීවේය. එය ඇසූ ක්ශනයෙන් ලමුන් කම්පයට පත් විය. ඔහු අප වෙනුවෙන් මිය ගිහින් ලමුන්ගේ සිතෙහි මෙය දෝංකාර දෙන්නට විය. ඔහුට මෙය අසීරු කයීක් වුවද ඔහු අපි වෙනුවෙන් ජීවිතය පුද කරා යැයි සියලු ලමුන්ගේ හදවතේ රැදුනි. එහි ඉතුරු වූයේ ඔහුගේ කඩුව පමනි. එයද කැඩී බිදී ගොස් ය.

පසුව සීසන්ස් හා ලමුන් එක් වී කඩුව රැගෙන එය රෙදි කඩකින් ඔතා වෛක්වුඩ් හි වලක් සාදා එයට හිම පියල්ලක් , මේපල් කොලයක් , නව දල්ලක් හා ගිම්හානයේදී පිපෙන මලක් එක් කල වසන්නට විය. සියලු දෙනා දුකින් ඔහුට ආචාර කල පිට වුහ.

නමුත් එක් සැනයකින් එතැන ලොකු එලියක් විහිදුනි පොලොවෙන් ඉවතට ආ කඩුව අහසේ පා වී බිමට වැටුනි. එක් විගස එය වැටෙන්නට පෙර දන ගසා ගත් කෙනෙක් එය අල්ලා ගත්තේය. එලිය ක්‍රමයෙන් අඩු විය. අර තැනැත්තාද නැගුට ලමුන් දෙස බැලීය. එක් වරම

“ ගෝඩ් ඔෆ් සීසන් ඔයා අයෙමත් ආවා…………………………..” කියමින් නෙකාලෝ , ඔරිටෝ , තියඩෝ , නිල්ටර් , ඩෙකර් , සෙල්ටර් හා රොබට් දුවගෙන් ගිහින් ගෝඩ් ඔෆ් සීසන්ව වැලදගෙන සතුට ප්‍රකාශ කලහ. සීසන්ස් ලත් ඉතාම සතුටු විය.

“ ඔබ තුමා නැවත කොහොමද ආවේ.. ඇත්තටම් අපි හිතුවේ අපිට ඔබව නැතිවුනා කියලා….” ස්ප්‍රින්ග් කීය

“ මගේ කඩුවත් සමග ඔයාල එක් කල මතයන් මට නැවත පණ දුන්නා . ආයෙ අපට කිසිම කරදරයක් නොවේවි. ඒ වගේම මේ ලමයින්ට ගෙදර යන්නත් පුලුවන් දැන්” ගෝඩ් ඔෆ් සීසන් කීය.

පසුව සීසන්ස් ඔහුට දන නමා ආචාර කරන්නට විය. පසුව නැවතත් ඔවුන් ඕක් ගසට යාමට සූදානම් විය. ඒ ලමුන්ව නැවත සිටි තැන් වලට යැවීමටය. සියල්ලෝම සූදානම් වී යන්නට සැරසී. ගෝඩ් ඔෆ් සීසන් ට ආචාර කරන්නට විය.

“ ආහ් ලමයිනේ මතක් කරලා ඔයාලා මේ ටික ඇරන් යන්න. මේ තියෙන්නෙ පුංචි කැටයම් වගයක් මේකෙ කැටයම් කරලා තියෙන්නෙ ඍ තු හතර හා මාව. ඔයාල මේක කටට තියලා මුමුනව්වොත් අපිට ඔයාලව ඇහෙනවා . මෙන්න ගන්න. ආහ්! ඒ වගේම තවත් දෙයක් ඔයාලා මෙහෙන් ආයෙත් එහෙට යනකොට තත්පරයක් වත් ගෙවිලා නැහැ. තේරුනාද? ඒ නිසා මේක රහසක් විදිහටම තියා ගන්න. “ ගෝඩ් ඔෆ් සීසන් කැටයම් බෙදමින් කීවේ ය.

“ ඕහ් මම හිතුවේ අපි මෙහෙ සතියක් විතර හිටියා කියලා. මොකද එතකොට විබාගෙ ඉවරනේ. ඒත් කමක් නෑ මේ නිසා දැන් අපිට history හොදට ලියන්න පුලුවන් වෙයි” සිනා සෙමින් නිල්ටර් කීය.

ලමුන්ට මෙය නම් කියා ගත නොහැකි තරම් අත්දැකීම් පිරුනු කැටයමක් විය. සියල්ලෝම යන්නට සූදානම් විය. පසු පසින්ම ගමන් කලේ රොබට් ය. මද වෙලාවක් රොබට් දෙස බලා සිටි ගෝඩ් ඔෆ් සීසන්,

“ රොබට් විනාඩියකට මෙහෙ එන්න.”

“ ඔයාට මොකක් හරි මට කියන්න තියෙනවද”

“ ඇත්තටම නෑ …. මිහ………….. ඔව් මට දෙයක් කියන්න තියෙනවා. ඇත්තටම මේක මගෙ අම්මා කියලා තියෙන කතා වගේ. ඒ වගේම අම්මා මම නැන්සි ග්‍රො එකට එන්න කලින් අපේ අම්ම හරිම අමුතුවට තමා මට කතා කලේ. ඒ වගේ ම ටිං.”

“ ඒ වගේම ටිංකබෙල් සීනුව කොහොමද ඔයාගෙ සාක්කුවට ආවෙ කියලත් ඔයාට ප්‍රශ්නයක් නේද? “

“ ඒක ඔයා  දන්නේ කොහොමද?’’

“ අම්මා  කීව කතන්දර එක්ක එහෙනම් ඔයා  කැමේලියාගේ කතන්දරේ දන්නවා ඇති නේද? “

“ ඔව් ඒත් ඔයා එයාව අර එවරස්ට් කියන කන්දේ තනි කලානේ.. තාමත් එයා එහෙ ඇති..’’

“ ඔයා එහෙමද හිතන්නේ රොබට්.. අර කතන්දරේ ඒ ගැහැනු ලමයගේ නම මොකද්ද රොබට්? ‘’

“ කැමේලියා  “

‘’ හොදයි… එතකොට ඔයාගෙ අම්මගෙ නම’’

“ මිසිස් තෝමස් ‘’

“ ඔව් එතකොට ඔයාලටවත් කවදාවත් කියලා නැති නමත් එක්ක මුලු නම? මොකද්ද රොබට් “

“ C. තෝ මස් “

“ ටිකක් හිතන්න රොබට් “

“ මො  මො  මොකා  අපේ අම්මා ……’’

“ ඔව් රොබට්. දැන් යන්න. කවදහරි ඔයත් අපේ කෙනෙක්….’’

කියන්වත් සමගම රොබට්ගේ කැටයම තදින් දිලිසුනි.රොබට් ට හිතා ගැනීමට නොහැකි විය...

නිමි!

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්